R0151

IHRA
UNIVERSITY OF COLOMBO

# Institute of Human Resource Advancement

මානව සම්පත් අභිවර්ධන ආයතනය
மனிதவள மேம்பாட்டு நிறுவகம்

කොළඹ විශ්වවිද්‍යාලය
கொழும்புப் பல்கலைக்கழகம்

275 Bauddhaloka Mawatha, Colombo 07. Sri Lanka.
බෞද්ධාලෝක මාවත, කොළඹ 07
பௌத்தாலோக்க மாவத்தை, கொழும்பு 07

ලැබුණා
05 FEB 2026
පාලන අංශය
ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
0642

2026 ජනවාරි මස 29 දින

ලේකම්
ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නව ලේකම් කාර්යාලය, මාලිගාවත්ත
කොළඹ 10

මහත්මියනි/ මහත්මයාණෙනි,

**ශ්‍රම කළමනාකරණවේදී උපාධිය (Bachelor of Labour Management Degree) සහ ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමාව (Diploma in Labour Education) සඳහා අයදුම්පත් කැඳවීම - 2026/27**

කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන ශ්‍රම කළමනාකරණවේදී උපාධිය (Bachelor of Labour Management Degree) සහ ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා (Diploma in Labour Education) පාඨමාලාවන්හි 2026/27 නව අධ්‍යයන වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම **2026** මාර්තු මස **31** වන දින දක්වා සිදුකරන බව සතුටින් දැනුම් දෙමි.

සේවක අධ්‍යාපනය ඉලක්ක කොට මානව සම්පත් අභිවර්ධනය මූලික අභිලාශය කර ගනිමින් සේවක ප්‍රජාව වෙනුවෙන් පමණක් ම පවත්වාගෙන යනු ලබන මෙම පාඨමාලාවන් සඳහා සම්බන්ධ වී තම අධ්‍යයන ඉලක්ක සපුරා ගැනීමට කැමැති ඔබ ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් මේ පිළිබඳව දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිමි.

අයදුම්පත් ඉදිරිපත් කිරීම මාර්ගගතව (online) සිදු කළ යුතු අතර අදාළ සියලු තොරතුරු කොළඹ විශ්වවිද්‍යාලීය මානව සම්පත් අභිවර්ධන ආයතනයේ (IHRA-UoC) වෙබ් අඩවියෙන් ලබා ගත හැක. මීට අදාළ දැන්වීමේ පිටපතක් මෙහි අමුණා ඇති අතර, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය **2026** මාර්තු මස **31** බව කරුණාවෙන් සලකන්න.

වැඩිදුර තොරතුරු සඳහා;

වෙබ් අඩවිය: https://www.ihra.cmb.ac.lk
දුරකථන: (+94) 112581504
විද්‍යුත් තැපැල: blm@ihra.cmb.ac.lk

ස්තූතියි
මෙයට,
විශ්වාසී

එස්.එස් සමරතුංග
නියෝජ්‍ය ලේඛකාධිකාරී


| | General | Director | Senior Assistant Bursar | Deputy Registar | Senior Assistant Registar |
|---|---|---|---|---|---|
| Telephone No. | 2 503 393 | 2 587 245 | 2 581 569 | 2 505 893 | 2 595 024 |
| Fax No. | | | 2 581 569 | 2 505 893 | |

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
# කොළඹ විශ්වවිද්‍යාලය



- ශ්‍රම කළමනාකරණවේදී උපාධිය - (වසර 03)
- ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව - (වසර 01)

## ශ්‍රම කළමනාකරණවේදී උපාධිය

### ඇතුළත්වීමේ සුදුසුකම් — මාධ්‍ය : සිංහල / ඉංග්‍රීසි

- අ. අ.පො.ස උසස් පෙළ විභාගයෙන් විෂයන් (පැරණි) 4ට අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයයන් ලබා සමත්ව සිටීම හෝ නව විභාගයෙන් විෂයන් 3ට අවම වශයෙන් එකවර සාමාන්‍ය (S) සාමාර්ථයයන් ලබා සමත් වීම.

  හෝ

  ආ. පිළිගත් ආයතනයකින් පිරිනමනු ලබන, ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශයේ 3 වන මට්ටමට සමාන (SLQF 3) ඩිප්ලෝමාවක් ලබා තිබීම.

  හෝ

  ඇ. මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් ප්‍රදානය කරනු ලබන ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව සමත්ව තිබීම.

  සහ

- වයස අවුරුදු 22 ට නොඅඩු අයෙකු වීම.

  සහ

- ඉහත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරාලීමෙන් පසු වසර දෙකකට නොඅඩු කාලයක් රැකියාවක හෝ ස්වයං රැකියාවක නිරත වූ සහ දැනටමත් රැකියාවේ හෝ ස්වයං රැකියාවක නිරත වන පුද්ගලයෙකු වීම.

  සහ

- මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය හා/හෝ සම්මුඛ පරීක්ෂණයේදී ආයතනය මගින් තීරණය කරනු ලබන අධ්‍යාපනික හැකියාව හා සූදානම්භාවය සපුරන පුද්ගලයෙකු වීම.

## ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව

### ඇතුළත්වීමේ සුදුසුකම් — මාධ්‍ය : සිංහල

- අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයන් 06ක් සම්මාන (C) සාමාර්ථයයන් 3ක් සහිතව එකවර සමත් වීම.

  සහ

- වයස අවුරුදු 22 ට නොඅඩු වීම.

  සහ

- ඉහත සඳහන් කළ අය සුදුසුකම් සපුරාලීමෙන් පසු වසර දෙකකට නොඅඩු කාලයක් රැකියාවක හෝ ස්වයං රැකියාවක නිරත වූ සහ දැනටමත් රැකියාවේ හෝ ස්වයං රැකියාවක නිරත වන පුද්ගලයෙකු වීම.

  සහ

- මානව සම්පත් අභිවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන යෝග්‍යතා පරීක්ෂණය හා/හෝ සම්මුඛ පරීක්ෂණයේදී ආයතනය මගින් තීරණය කරනු ලබන අධ්‍යාපනික හැකියාව හා සූදානම්භාවය සපුරන පුද්ගලයෙකු වීම.

## පාඨමාලා ගාස්තු

පාඨමාලා ගාස්තුවක් නොමැත.
ලියාපදිංචි ගාස්තු පමණක් අය කරනු ලැබේ.

### සැලකිය යුතුයි

- ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට සැලකිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාවක් නොසිටියහොත්, සිංහල මාධ්‍යයෙන් පමණක් පාඨමාලාව පවත්වනු ලැබේ.

### දේශන පැවැත්වීම

- සතියේ දිනවල පස්වරු 5.00 සිට 8.00 දක්වා කොළඹ විශ්වවිද්‍යාලයේදී.

### අයදුම්පත් ඉදිරිපත් කිරීම

- අයදුම්පත් මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ පමණක් යොමු කළ යුතුය.
- www.ihra.cmb.ac.lk යන වෙබ් අඩවියට පිවිස සිදු කළ යුතුය. අයදුම්පත පිරවීමට පෙර විස්තර පත්‍රිකාව නිවැරදිව කියවා බලන්න.

**අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය**

**2026.03.31**

විමසීම්
011 250 3393
011 250 7563
011 258 1504

නියෝජ්‍ය ලේඛකාධිකාරි, මානව සම්පත් අභිවර්ධන ආයතනය
අංක 275, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.

www.ihra.cmb.ac.lk